සභාපති
தவிசாளர்
Chairman — (+94) 011 2556840

ලේකම්
செயலாளர்
Secretary — (+94) 011 2556831

කාර්යාලය
காரியாலயம்
Office — (+94) 0112556833, 0112556834

ෆැක්ස්
தொலைநகல்
Fax — (+94) 011 2556835, 011 2556837

විද්‍යුත් තැපැල
மின்னஞ்சல்
e-mail — fincom@sltnet.lk

# මුදල් කොමිෂන් සභාව
( ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 'ර' ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලදි.)

# நிதி ஆணைக்குழு
(அரசியலமைப்பின் 154 ஏ ஆம் உறுப்புரையின்கீழ் தாபிக்கப்பட்டது)

# FINANCE COMMISSION
(Established under Article 154 R of the Constitution)

48, වජිර පාර,
කොළඹ 04, ශ්‍රී ලංකා.
48, வஜிர வீதி,
கொழும்பு-04, இலங்கை.
48, Vajira Road,
Colombo 04, Sri Lanka.

මගේ අංකය / எனது இல / My No: FC/3/3/2015
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2015.12.30

මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 2016/01

ප්‍රධාන ලේකම්

බස්නාහිර/මධ්‍යම/දකුණු/උතුරු/නැගෙනහිර/වයඹ/උතුරු මැද/ඌව/සබරගමුව පළාත

**<u>ප්‍රාග්ධන අරමුදල් යටතේ පළාත් වාර්ෂික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පිළිපැදිය යුතු ක්‍රියාමාර්ග</u>**

මෙම චක්‍රලේඛය 2016 ජනවාරි 01 දින සිට බලපැවැත්වේ. ඒ අනුව, මුදල් කොමිෂන් සභාව විසින් මෙයට පෙර මෙම විෂයයට අදාලව 2015.03.25 දින නිකුත් කර ඇති අංක 2015/1 දරන චක්‍රලේඛය මෙයින් අවලංගු වේ.

මෙම චක්‍රලේඛයේ ප්‍රාග්ධන අරමුදල් ලෙස නිර්වචනය කෙරෙනුයේ, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අය-වැය ඇස්තමේන්තුවල සඳහන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, උපමාන පාදක ප්‍රදාන, පළාත්වල ක්‍රියාත්මක කරනු ලබන වෙනත් දේශීය හා විදේශීය ව්‍යාපෘති අරමුදල් සහ පළාත් විසින් ස්වකීය ආදායමෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස සලකනු ලබන සියලුම අරමුදල් ය. මෙම අරමුදල් යොදවා පළාත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී පහත දැක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ.

1. ඉදි කිරීම් කටයුතු

 1.1. ගොඩනැගිලි:

  1.1.1. ගොඩනැගිලි ඉදිකිරීම පළාතේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි හා ඊට අදාල පිරිවැය ඇස්තමේන්තු යථාර්ථවාදී අයුරින් සැකසීමට පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ඉංජිනේරුවරුන් හා කාර්මික නිලධාරීන් විසින් වගබලා ගත යුතුය.

  1.1.2. අදාල ආයතනය සතුව නිරවුල් හිමිකම පවතින ඉඩම්වල පමණක් ගොඩනැගිලි ඉදි කිරීම කළ යුතුය.

  1.1.3. ජාතික මට්ටමේ රාජ්‍ය ආයතනයන් විසින් ගොඩනැගිලි ඉදිකිරීමේ දී දැනට පිළිගෙන ඇති අනුමත ගොඩනැගිලි සැලසුම් (Type Plans) පළාත් විසින් ද අනුගමනය කළ යුතුය.

1.1.4. 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත ශුන්‍ය පාදක අයවැය ප්‍රවේශයට අනුගත වන පරිදි, සෑම ඉදිකිරීම් කාර්යයක්ම අදාල වර්ෂය සඳහා ඉලක්ක කළ පරිදි නිම් කළ යුතු වේ. කිසියම් ඉදිකිරීමක් එම වර්ෂය තුළ සම්පූර්ණයෙන් නිම කිරීමට අපහසු වන්නේ නම්, එම කාර්යය අදියරගතකර නව ව්‍යාපෘතියක් ලෙස ඉදිරි වර්ෂ සඳහා සකස් කරනු ලබන සංවර්ධන සැලසුම්වලට ඇතුළත් කළ යුතු වේ. අපේක්ෂිත සමස්ත ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැයට මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගත යුතුය. සෑම අදියරක්ම සැලසුම් කළ යුත්තේ, එම අදියර නිම කළ පසුව ප්‍රමාදයකින් තොරව ප්‍රතිලාභීන්ගේ ප්‍රයෝජනය සඳහා එය යෙදවිය හැකි වන පරිදිය.

1.1.5. මහජනතාවට සේවාවන් සැපයීම පහසු හා කාර්යක්ෂමව සිදු කළ හැකි වන පරිදි ගොඩනැගිලි සැලසුම් කළ යුතු අතර, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා සුදුසු ප්‍රවේශ පහසුකම් සැලසිය යුතුය.

1.1.6. දැනට පළාත් ආයතන සතු භාවිතයට නොගන්නා ගොඩනැගිලි පිළිබඳව අධ්‍යයනයක් සිදු කර, හඳුනාගත් එවැනි ගොඩනැගිලි වෙනත් සුදුසු ආයතනයක ප්‍රයෝජනය සඳහා විධිමත් ලෙස භාර දීමට පියවර ගත යුතුය.

1.1.7. ගොඩනැගිලි සැලසුම් කිරීමට සමගාමීව එම ගොඩනැගිලි භාවිතයට ගැනීමට අත්‍යාවශ්‍ය යටිතල පහසුකම්, උපකරණ හා අනෙකුත් සම්පත් පිළිබඳව තක්සේරුවක් සිදුකර, ඒවායේ පිරිවැය හා එමගින් අපේක්ෂිත ප්‍රතිඵල ව්‍යාපෘති වාර්තාවලට ඇතුළත් කළ යුතුය.

1.1.8. කාර්යාල ගොඩනැගිලිවල විදුලි ආලෝකය සහ වායු සමීකරණ අවම ලෙස භාවිත කිරීමට හැකි වන පරිදි එම ගොඩනැගිලි ඉදිකිරීමේ දී මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සැලසුම් කළ යුතුය.

1.1.9. ගොඩනැගිලි, ක්‍රීඩාභූමි හා අනෙකුත් පොදු ස්ථාන වටා ආරක්ෂිත තාප්ප හා වැටවල් ඉදිකිරීමේදී හැකිතාක් දුරට පිරිවැය අවම කළ යුතුය.

1.1.10. ගරාජ්, ආලින්ද හා අනෙකුත් අත්‍යවශ්‍ය අංග ඇතුළත්ව මාණ්ඩලික නිලධාරීන් සඳහා ඉදිකරනු ලබන නිල නිවසක් වර්ග අඩි 1,750 ක් ද සෙසු නිලධාරීන් සඳහා ඉදිකරනු ලබන නිල නිවසක් වර්ග අඩි 1,200 ක් ද නොඉක්ම විය යුතු වේ. පවත්නා ඉඩම් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම උදෙසා දෙමහල් නිල නිවාස සැලසුම් කිරීම වඩාත් යෝග්‍ය වේ.

1.2 මාර්ග:

පළාත් සහ පළාත් පාලන මාර්ග ඉදිකිරීමේ දී මෙන්ම වැඩිදියුණු කිරීමේ දී ඒවා කල් පවත්නා අයුරින් පවත්වාගැනීම සඳහා කාපට් කිරීම, තාර දැමීම හෝ කොන්ක්‍රීට් කිරීම කළ යුතු අතර, බොරළු දැමීම වැනි තාවකාලික ක්‍රියාමාර්ග සිදු නොකළ යුතුය. මෙහිදී, මාර්ගයේ තිරසාර පැවැත්මට බලපාන බෝක්කු, පාලම්, පැති බැම්ම හා පැති කාණු ආදිය ඉදි කිරීම කෙරෙහිද ප්‍රමුඛතාවය දිය යුතුය. ග්‍රාමීය

නිෂ්පාදන, වෙළඳපොළ වෙත ප්‍රවාහනය කිරීම හා අනෙකුත් සේවාවන් ලබා ගැනීම සඳහා නගරවලට පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි වන පරිදි පළාත් හා පළාත් පාලන මාර්ග, ජාතික මාර්ග පද්ධතිය සමග සම්බන්ධ කළ යුතුය. නිරතුරුවම මාර්ග අබලන් වීම අවම කිරීම සඳහා මාර්ග ඉදි කරන හා වැඩිදියුණු කරන අවස්ථාවේදීම ඒවා නඩත්තු කිරීම සඳහා සුදුසු ක්‍රමවේද සකස් කළ යුතුය.

### 1.3 කුඩා වැව් හා සුළු වාරිමාර්ග:

කුඩා වැව් හා සුළු වාරිමාර්ග ඉදිකිරීම, සංවර්ධනය, ප්‍රතිසංස්කරණය හා නඩත්තුව සඳහා අරමුදල් යෙදවීමේදී, අදාල ජලාශයේ සිට ගොවිබිම දක්වා ජල සැපයුමට අත්‍යවශ්‍ය සෑම අංගයක් පිළිබඳවම අවධානය යොමු කළ යුතුය. මෙහිදී, ගොවි සංවිධානවල සක්‍රිය දායකත්වය ලබාගත යුතු අතර, එම දායකත්වය පිරිවැය ඇස්තමේන්තුවල ඇතුළත් විය යුතුය.

## 2. ඉදිකිරීම් කොන්ත්‍රාත් පිරිනැමීම:

වරින්වර නිකුත් කරනු ලබන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මගින් පනවන ලද සීමාවන් නොඉක්මවන පරිදි ඉදිකිරීම කොන්ත්‍රාත් පිරිනැමීම සිදු කළ යුතුය. විශාල පරිමාණ ඉදිකිරීම විවෘත ටෙන්ඩර් පරිපාටියට අනුව සිදු කළ යුතු අතර, නියමිත මූල්‍ය සීමාව ඇතුළත පළාත් සභාවේ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් අතරින් මිල ගණන් කැඳවා සුදුස්සන් තෝරාගෙන කොන්ත්‍රාත් පිරිනැමීම මගින් අනෙකුත් ඉදිකිරීම කළ යුතුය. එසේම, සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ලියාපදිංචි සමිතිවලට කොන්ත්‍රාත් පිරිනැමීමේදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

## 3. භාණ්ඩ හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා භාවිතය:

නව මිලදී ගැනීම්වලට පෙර දැනට පවතින භාණ්ඩ හා යන්ත්‍රෝපකරණවල තත්ත්වය පිළිබඳව මනා අධ්‍යයනයක් සිදුකර, අවශ්‍යතාවල ප්‍රමුඛත්වය මත පමණක් නව මිලදී ගැනීම සිදු කළ යුතුය. මිලදී ගැනීමට අපේක්ෂිත භාණ්ඩ හා යන්ත්‍රෝපකරණ භාවිතා කිරීම සඳහා අවශ්‍ය දැනුම, ඵලදායී භාවිතය සඳහා අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය හා ඒවා ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය අනිකුත් යටිතල පහසුකම් පිළිබඳව සැලකිලිමත් විය යුතුය. භාණ්ඩ හා යන්ත්‍රෝපකරණ මිලදී ගනු ලබන අවස්ථාවේදීම ඒවා නඩත්තු කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකසා ගත යුතු වේ. සියලු මිලදී ගැනීම් රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව සිදු කළ යුතුය.

## 4. වාහන මිලදී ගැනීම හා භාවිතය:

වාහන මිලදී ගැනීමේ දී, ඒ පිළිබඳව මහා භාණ්ඩාගාරය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛවල දැක්වෙන විධිවිධාන අනුගමනය කළ යුතු වේ. වාහන මිලදී ගැනීමේදී මුදල් කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරය වෙත ඉල්ලීම් කළ යුතු වේ. භාවිතයට නොගන්නා

වාහන රජයේ පිළිගත් ක්‍රමවේදයන් තුළ පැවරීම හෝ අපහරණය කිරීම කළ යුතු අතර, ඉන් ලැබෙන ආදායම පළාත් අරමුදලට බැර කළ යුතුය.

නිල වාහන ලබා දී ඇති නිලධාරීන්ට කිසිදු විටක සංචිත වාහන ලබා දීමට කටයුතු නොකළ යුතු අතර, නිලධාරීන් සඳහා වාහන ලබා දීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාගේ දැඩි අධීක්ෂණය යොමු විය යුතු විය යුතුය.

5. ස්වයං රැකියා දිරි ගැන්වීම:

විධිමත් ක්‍රමවේදයකට අනුව තෝරාගත් ප්‍රතිලාභීන්ට ස්වයං රැකියා ආරම්භ කිරීම දිරිගැන්වීම සඳහා අදාල ස්වයං රැකියාවට ගැලපෙන පරිදි භාණ්ඩ හා උපකරණ ලබාගැනීම පිණිස සාධූබල සැපයීමක් ලෙස කිසියම් ප්‍රදානයක් ලබාදිය හැකිය. සංවර්ධන කටයුතු සඳහා පළාත් මන්ත්‍රීවරුන්ට ලබාදෙනු ලබන ප්‍රතිපාදන හැර, අනෙකුත් ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් එක් එක් පුද්ගලයාට හෝ පවුල් ඒකකයකට පෞද්ගලික වන සේ සානුබල දීමනා ලබාදීමේ දී රු.100,000/- ක උපරිමයට යටත් විය යුතු අතර, එසේ ලබාදෙන සානුබල දීමනාවේ වටිනාකමින් අවම වශයෙන් 50% ක ප්‍රතිලාභී දායකත්වයක් අයකර ගත යුතුය.

ස්වයං රැකියාවන් දිරිගැන්වීමට අදාලව කටයුතු කරන ලියාපදිංචි සමිතිවලට ලබාදෙන සානුබල දීමනාව රු.200,000/- ක උපරිමයකට යටත්ව ලබාදිය යුතු අතර, සමිතියේ දායකත්වය අවම වශයෙන් 50% ක් විය යුතුය. මෙලෙස ලබා දෙන සියලුම සානුබල දීමනා ආදායම් උත්පාදනය අරමුණු කරගෙන ලබාදිය යුතු අතර, පාරිභෝජන ස්වරූපයේ භාණ්ඩ මිලදී ගැනීම සඳහා ඒවා ලබා නොදිය යුතුය. මෙලෙස ස්වයං රැකියා දිරිගැන්වීමට ලබාදෙන සානුබල දීමනා මගින් සිදු කරනු ලබන කාර්යයන් පිළිබඳව පසුවිපරම් කටයුතු සිදු කළ යුතු අතර, ඒ පිළිබඳව අර්ධ වාර්ෂිකව ප්‍රධාන ලේකම් වෙත ප්‍රගතිය වාර්තා කළ යුතුය.

6. පරිසර සංරක්ෂණය:

හරිත සංවර්ධන සංකල්පයට අනුගත වෙමින් සෑම ආකාරයකම ඉදිකිරීම්වල දී පරිසරය සුරැකෙන පරිදි රජය විසින් හඳුන්වාදී ඇති පාරිසරික සංරක්ෂණ නීතිරීතිවලට අදාල මූලික විධිවිධාන අනුගමනය කළ යුතු වේ. ඉදිකරන අවස්ථාවේ දී සහ ඉන් පසුව ද අදාල ආයතන විසින් පරිසර දූෂණය වළක්වාලීම සඳහා සුදුසු තාක්ෂණය භාවිතා කරමින් ඒ සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

7. උපමාන පාදක ප්‍රතිපාදන යටතේ පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් යෝජනා කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති

සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා වෙන් කෙරෙන උපමාන පාදක ප්‍රදාන වියදම් කිරීමේ දී පහත දැක්වෙන කාර්යයන් සඳහා ඒවා ඉදිරියෙන් දක්වා ඇති ප්‍රතිශතයන් අනුගමනය කළ යුතුය.

| | |
|---|---|
| ආර්ථික යටිතල පහසුකම් | 30% |
| සමාජ යටිතල පහසුකම් | 30% |
| ස්වයං රැකියා ප්‍රවර්ධනය | 20% |
| වාරිමාර්ග හා කෘෂි කර්ම | 10% |
| ආගමික, සංස්කෘතික හා කලා කටයුතු | 10% |
| එකතුව | 100% |

7.1 ආර්ථික යටිතල පහසුකම් - 30%

i. ග්‍රාමීය මාර්ග

- ගම තුළ හා ගම් අතර ප්‍රවාහන පහසුකම් සංවර්ධනය කළ යුතු අතර, ගමේ පොදු ස්ථාන (පාසල, ආගමික ස්ථාන, වෙළඳපළවල්, සෞඛ්‍ය සායන, පොදු ළිං, සුසාන භූමි වැනි) සඳහා වන ප්‍රවේශ මාර්ග සංවර්ධනය සඳහා ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු වේ.

- මාර්ගවල පැති කාණු, පැති බැමි, බෝක්කු හා කුඩා පාලම් ආදිය සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබා දිය යුතු වේ.

- පොදුවේ භාවිතයට ගනු ලබන කුඩා පාරවල් කොන්ක්‍රීට් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

- මෙම යටතේ සංවර්ධනය සඳහා තෝරා ගනු ලබන මාර්ග, ග්‍රාමීය සංවර්ධන මාර්ග, කෘෂි මාර්ග හා ඌණ සේවා ගම්මාන සඳහා ලබාදෙන පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා වෙනත් අරමුදල් යොදවා සංවර්ධනය කරනු ලබන මාර්ග සමග ද්විකරණය නොවිය යුතුය.

ii. පානීය ජලය

සුදුසු ජල මූලාශ්‍රයකින් පානීය ජලය ලබාදීම මෙම යටතේ සිදු කළ හැකිය. ජල මූලාශ්‍රයේ ප්‍රමිතිය පිළිබඳව ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙතින් තහවුරු කරගත යුතු අතර, ඒ සඳහා තත්ව පාලන වාර්තාවක්ද ලබාගත යුතුය. පානීය ජල ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදී හා නඩත්තු කිරීමේදී ප්‍රජා දායකත්වය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

iii. විදුලිය

ලංකා විදුලිබල මණ්ඩලය විසින් පිළිගනු ලබන ප්‍රමාණවත් නිවාස සංඛ්‍යාවක් ඇති ප්‍රදේශවලට පොදු විදුලි දිගුවක් ලබාදීම සඳහා මෙම අරමුදල් භාවිතයට ගත හැක.

### 7.2 සමාජ යටිතල පහසුකම් - 30%

**i. අධ්‍යාපනය**

- වෙනත් අරමුදල් ප්‍රභවයන් යොදවා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සමග ද්විකරණය නොවන පරිදි රජයේ පාසල්වල ගොඩනැගිලි අලුත්වැඩියාව, ආරක්ෂිත වැට හා ගේට්ටු ඉදිකිරීම, සනීපාරක්ෂක කටයුතු සහ පානීය ජලය ලබා දීම, ක්‍රීඩා භූමි, ළමා උද්‍යාන ඉදිකිරීම හා සංවර්ධනය සිදු කළ හැකිය.

- ලියාපදිංචි පෙර පාසල් සඳහා ඩෙස්, පුටු හා අනෙකුත් අත්‍යාවශ්‍ය උපකරණ ලබාදීමේ දී උපරිම ප්‍රතිපාදනය රු. 30,000/- ක් විය යුතුය. වසර පහක් ඇතුළත එකම ආයතනයකට මෙබඳු උපකරණ නැවත ලබා නොදිය යුතුය.

- පළාත් පාලන ආයතන හෝ පාසල්වලට අයත් පුස්තකාල සඳහා පොත් ලබාදීමේ දී උපරිමය රු.25,000/- ක් විය යුතු අතර, දැනටමත් ප්‍රමාණවත් පොත් සංඛ්‍යාවක් නොමැති පුස්තකාල සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

- අධ්‍යාපනයට දක්ෂ එහෙත් පවුලේ ආදායම් මට්ටම අඩු වීම නිසා පොත්පත් හා අධ්‍යාපනික උපකරණ මිලදී ගැනීමට අපොහොසත් සිසුන් සඳහා එක් සිසුවෙකුට වසරකට රු. 5,000/- ක උපරිමයකට යටත්ව අධ්‍යාපනික උපකරණ (පොත්පත්, පෑන් පැන්සල්, කවකටු පෙට්ටි හා පොත් බෑග් වැනිදෑ) ලබා දිය හැකිය. පවුලේ ආදායම් තත්ත්වය පිළිබඳව ග්‍රාම නිලධාරීගේ හා අදාල සිසුවාගේ දක්ෂතාවය පිළිබඳව පාසලේ විදුහල්පතිගේ නිර්දේශය ලබා ගැනීමෙන් අනතුරුව අදාල පන්ති භාර ගුරුවරයා මාර්ගයෙන් අදාල සිසුවාට එම පරිත්‍යාගය සිදු කළ යුතු වේ. ඒ සම්බන්ධයෙන් පාසලේ අනෙකුත් සිසුන් දැනුවත් නොකළ යුතු අතර, මෙම අරමුදල් භාවිතයට ගෙන සිසුන්ට පොදුවේ පොත් පත් හා උපකරණ ලබාදීම සිදු නොකළ යුතුය.

**ii. සෞඛ්‍යය හා සමාජ සේවා**

- ග්‍රාමීය සෞඛ්‍ය සායන පවත්වනු ලබන ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම, ජල සැපයුම ලබාදීම හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සිදු කළ හැකිය.

- ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථානවලට අවශ්‍ය පුටු හා බංකු වැනි උපකරණ සැපයිය හැකි අතර, සපයනු ලබන භාණ්ඩ අදාල සෞඛ්‍ය මධ්‍යස්ථානයේ භාණ්ඩ ලේඛනයට ඇතුළත් කළ යුතුය.

- අඩු ආදායම්ලාභී පවුල්වල විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට, විශේෂයෙන් පාසල් යන වයසේ දරුවන්ට රු.35,000/- ක උපරිමයකට යටත්ව ඔවුන්ගේ දෛනික ජීවිතය පහසු කරවන විශේෂිත උපකාරක උපකරණ එක් වරක් පමණක් ලබා දිය හැකිය. මෙම උපකරණ ඔවුන්ගේ විශේෂ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි විය යුතුය. මෙවැනි උපකරණ ලබාදීමේ දී ඒ සඳහා වෛද්‍ය නිර්දේශය සහ පළාත් සමාජ සේවා අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගත යුතු වේ.

iii. නිවාස

- නිවසක ඉදිකිරීම හෝ අලුත්වැඩියා කටයුතු සඳහා එක් ප්‍රතිලාභී පවුලකට රුපියල් 40,000/- ක උපරිමයකට යටත්ව, ඉඩමේ හිමිකම තහවුරු කරගැනීමෙන් පසු අනුග්‍රාහක මුදලක් ලබා දිය හැකිය. මෙහිදී ප්‍රතිලාභී දායකත්වය හා ස්වයං උපකාරක ප්‍රවේශය යන මූලධර්ම අනුගමනය කළ යුතු අතර, ප්‍රගතිය මත පදනම්ව කොටස් වශයෙන් අනුග්‍රාහක අරමුදල් ලබා දිය යුතුය. තවද, මෙය නිවාස අමාත්‍යාංශයේ ජාතික වැඩපිළිවෙල සමග ද්විකරණය නොවිය යුතුය.

- මෙම අනුග්‍රාහක මුදල සඳහා හිමිකම් ඇත්තේ පහත සඳහන් එක් කරුණක් සපුරන පවුල්වලට පමණි.මෙම කරුණු අදාළ ග්‍රාම නිලධාරී මඟින් සහතික කර යුතුය.
  - i දිළිඳු සහනාධාරලාභියෙකු වීම
  - ii පවුලේ ආදායම උපයන්නා මිය යාම නිසා අසරණභාවයට පත්ව සිටීම
  - iii ගෘහ මූලිකයා කාන්තාවක් වන අඩු ආදායම්ලාභී පවුලක් වීම

- පාසල් අධ්‍යාපනය ලබන දරුවන් සිටින අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් නිවාස සඳහා විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට එක් ප්‍රතිලාභී පවුලකට රු.15,000/- ක උපරිමයකට යටත්ව අනුග්‍රාහක මුදලක් ලබා දිය හැකිය. ආදායම් තත්වය පිළිබඳව ග්‍රාම නිලධාරීගේ සහතිකයක් ලබාගත යුතුය. නිවසකට විදුලිය ලබා ගැනීම උදෙසා ලබාදෙන මෙම මුදල ගෙවිය යුත්තේ විදුලි බලය සපයනු ලබන ආයතනයටය.

iv. ග්‍රාම සංවර්ධනය

- වසර 02 කට වඩා වැඩි කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි මරණාධාර සහ ග්‍රාම සංවර්ධන සමිති සඳහා අවශ්‍යතාවය මත පදනම්ව පුටු හා එකලස් කළ හැකි තාවකාලික ආවරණ රු. 30,000/- ක උපරිමයකට යටත්ව ලබා දිය හැකිය. වසර පහක් ඇතුළත එකම සමිතියකට මෙබඳු උපකරණ නැවත ලබා නොදිය යුතුය.

- එම උපකරණ පොදු සුභසාධන කටයුතු සඳහා භාවිතා කළ යුතු අතර, අදාල ආයතනයේ භාණ්ඩ වට්ටෝරු ලේඛනයට ඒවා ඇතුළත් කළ යුතුය.

- ඉහත භාණ්ඩ ලබා දීමේදී අදාල ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය හා ග්‍රාම සංවර්ධන නිලධාරීගේ සම්බන්ධීකරණය ලබා ගත යුතු අතර, විධිමත් පරිදි භාණ්ඩ භාරදී ලේඛනගත කිරීම කළ යුතුය.

- පාසල්, වෛද්‍ය සායන, මධ්‍යම බෙහෙත් ශාලා හා ග්‍රාම සංවර්ධන ශාලා වැනි පොදු ස්ථානවලට රුපියල් 30,000/- ක උපරිමයකට යටත්ව විදුලිය ලබා දිය හැකි අතර, එවැනි අවස්ථාවල දී විදුලි බලය සපයන ආයතනයට මුදල් යොමු කළ යුතුය.

- පානීය අවශ්‍යතා හෝ ස්නානය සඳහා භාවිතා කරනු ලබන පොදු ළිං ඉදිකිරීම හෝ අලුත්වැඩියාව සඳහා රු. 25,000/- ක උපරිමයකට යටත්ව අනුග්‍රාහකත්වය ලබා දිය හැකිය. එම අනුග්‍රාහකත්වය ලබාදිය යුත්තේ ලියාපදිංචි සමිතියක් හරහා පමණි. මේ සඳහා ග්‍රාම සංවර්ධන නිලධාරිවරයාගේ සම්බන්ධීකරණය ලබාගත යුතුය. මෙහිදී ප්‍රතිලාභී දායකත්වය ලබා ගැනීම අනිවාර්ය වේ.

v. ක්‍රීඩා කටයුතු

- පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂගේ හා විෂයය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලැබූ ක්‍රීඩා නිලධාරියෙකුගේ නිර්දේශය මත ලියාපදිංචි ක්‍රීඩා සමිති සඳහා රු.25,000/- ක උපරිමයකට යටත්ව වසර 05 කට වරක් ක්‍රීඩා භාණ්ඩ ලබා දිය හැක.

- මෙයට පෙර අදාල ක්‍රීඩා සමිතියට ලබා දී ඇති ක්‍රීඩා භාණ්ඩ හා ආම්පන්න පිළිබඳව හා ඒවායේ භාවිතය පිළිබඳව ඇගයීමක් සිදු කළ යුතුය.

- දිස්ත්‍රික්, පළාත්, ජාතික හා අන්තර්ජාතික මට්ටමේ ක්‍රීඩා තරඟ නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අත්‍යවශ්‍ය වන ඇඳුම්, පාවහන් හෝ ක්‍රීඩා භාණ්ඩ ලබා ගැනීම සඳහා, අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් එක් ක්‍රීඩකයෙකුට දිස්ත්‍රික් මට්ටමේ තරඟ සඳහා රු. 4,000/- ක්, පළාත් මට්ටමේ තරඟ සඳහා රු. 6,000/- ක් හා ජාතික මට්ටමේ තරඟ සඳහා රු.8,000/- ක් සහ ජාත්‍යන්තර මට්ටමේ තරඟ සඳහා රු. 10,000/- ක් වන පරිදි අනුග්‍රාහක දීමනා ලබා දීම ද සිදුකළ හැකිය.

## 7.3 ස්වයං රැකියා ප්‍රවර්ධනය - 20%

මෙම යටතේ සානුබල දීමනා ලබා දිය හැකි වනුයේ ස්වයං රැකියාවක් අළුතින් ආරම්භ කිරීමට හෝ ආරම්භ කර ඇති ස්වයං රැකියාවක් වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරනු ලබන පුද්ගලයින්ට අවශ්‍ය කරනු ලබන උපකරණ මිලට ගැනීම සහ රැකියාභිමුඛ පුහුණුවීම් කටයුතු වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු ආවරණය කර ගැනීම සඳහා වේ. මෙහිදී, පහත දැක්වෙන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

- කිසියම් ව්‍යාපෘතියක් සඳහා එක් පුද්ගලයෙකුට උපරිමය රු. 75,000/- ක් වන සේ ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය වන උපකරණ ලබාදිය හැකි අතර, මෙහිදී 50% ප්‍රතිලාභී දායකත්වය ලබා ගත යුතු වේ. මේ යටතේ පාරිභෝගික භාණ්ඩ බෙදා දීම කිසිසේත්ම සිදු නොකළ යුතුය.

- එබඳු සෑම ව්‍යාපෘතියක් සඳහාම ව්‍යාපෘති වාර්තාවක් පිළියෙල කළ යුතු අතර, එයට අදාල විෂය භාර දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් හා පළාත් සැලසුම් අංශයෙන් නිර්දේශ ලබා ගත යුතුය.

- රැකියාභිමුඛ පුහුණු පාඨමාලාවක් සඳහා යන වියදමින් 80% ක ප්‍රතිශතයක් අනුග්‍රාහක දීමනාවක් ලෙස ලබා දිය හැකි අතර, ඒ සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ එක් පුද්ගලයෙකුට ලබා දිය හැකි උපරිම මුදල රු. 20,000/- කි.

- රැකියාභිමුඛ පුහුණු පාඨමාලාවක් සඳහා අවශ්‍ය මුදල රු. 20,000/- ඉක්මවන අවස්ථාවක දී ඉතිරි මුදල ප්‍රතිලාභියා විසින් ගෙවා ඇති බව තහවුරු වූ පසු එකහ වූ මුදල යෝජිත පුහුණු ආයතන වෙත නිදහස් කළ යුතුය.

- ගෘහ භාණ්ඩ නිෂ්පාදනය, විදුලි උපකරණ අලුත්වැඩියාව, වාහන අලුත්වැඩියාව, පැස්සුම්, බර වාහන හා යන්ත්‍රෝපකරණ මෙහෙයවීම සහ විදේශ භාෂා වැනි පුහුණු පාඨමාලා සඳහා අනුග්‍රාහක දීමනා ලබාදීමේ දී එම පුහුණුව අදාල ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) රාමුවට අනුකූල විය යුතුය.

- වෙනත් ක්‍රමයකින් ආවරණය නොවූ හා මීට පෙර මෙවැනි අනුග්‍රාහක දීමනාවක් ලැබී නොමැති අය මේ සඳහා තෝරා ගත යුතු අතර, මෙම දීමනා ලබාදීමේ දී පහත දැක්වෙන පුද්ගල කාණ්ඩ කෙරෙහි ප්‍රමුඛතාවයක් දැක්විය යුතුය.

    i. අවු: 18 ත් 35 ත් අතර සිටින තරුණ තරුණියන්

    ii. වැන්දඹුවන්

    iii. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්

- පුහුණු දීමනා ලබාගත් ප්‍රතිලාභීන් පුහුණුවෙන් පසු ව්‍යවසාය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන බවට අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා හා පළාත් සැලසුම් අංශය විසින් පසු විපරම කළ යුතු අතර, ඒ පිළිබඳ ප්‍රගතිය ප්‍රධාන ලේකම් වෙත වාර්තා කළ යුතුය.

7.4 වාරිමාර්ග හා කෘෂිකර්ම - 10%

i. වාරිමාර්ග

- කුඩා වාරිමාර්ග, ඇළවේලි හා අමුණු ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය මේ යටතේ සිදු කළ හැකිය.

- ගොවි සංවිධාන හෝ ගොවි කණ්ඩායමක් විසින් නඩත්තු කරනු ලබන පොදු කෘෂි ළිං ඉදි කිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා අරමුදල් ලබා දිය හැකිය. මෙම කටයුතු සඳහා 50% ක ප්‍රතිලාභී දායකත්වය ලබාගැනීම අනිවාර්ය වන අතර, එක් ව්‍යාපෘතියක් සඳහා යෙදවිය හැකි උපරිම මුදල රු. 40,000/- කි.

ii. කෘෂිකර්මය

- කෘෂි ආම්පන්න ලබාදිය යුත්තේ ලියාපදිංචි ගොවි සංවිධානවලට පමණි. ගොවි සංවිධානයකට ලබාදිය හැකි කෘෂි ආම්පන්නවල වටිනාකමෙහි උපරිමය රු.50,000/- ක් විය යුතු අතර, ඒවා වසර 05 කට වරක් පමණක් ලබාදිය යුතුය. මෙහිදී 50% ක ප්‍රතිලාභී දායකත්වය ලබාගැනීම අනිවාර්ය වේ.

- ඉහත පරිදි කෘෂි ආම්පන්න ලබාදීමේ දී පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නිර්දේශය ලබාගත යුතු අතර, එලෙස ලබාදෙන ආම්පන්න ගොවි සංවිධානයේ භාණ්ඩ වට්ටෝරු ලේඛනයට ඇතුළත් කිරීමට වග බලාගත යුතුය.

- ගොවි සංවිධානයට ලබාදෙන ආම්පන්න පොදුවේ ගොවීන් විසින් භාවිතා කළ යුතු අතර, ඒවා පුද්ගලික මට්ටමින් නිකුත් නොකළ යුතුය. තවද, මෙයට පෙර අදාල ගොවි සංවිධානයට ලබා දී ඇති උපකරණ හා ආම්පන්න පිළිබඳව හා ඒවායේ භාවිතය පිළිබඳව ඇගයීමක්ද සිදු කළ යුතුය.

7.5 ආගමික, සංස්කෘතික හා කලා කටයුතු - 10%

- ආගමික ස්ථානවල ගොඩනැගිලි අළුත්වැඩියාව, පාරම්පරික නැටුම් හා වෙනත් කලා කටයුතු සංරක්ෂණය හා ප්‍රවර්ධනය සහ ආගමික, සංස්කෘතික හා කලා කටයුතු යටතේ ගැසට් මගින් ප්‍රකාශයට පත්කරන ලද පෙරහැර පැවැත්වීම සඳහා අනුග්‍රාහක මුදලක් ලබාදිය හැකිය. මේවා තෝරා ගැනීමේ දී පළාත් සංස්කෘතික නිලධාරීන්ගේ නිර්දේශය ලබාගත යුතුය.

- දහම් පාසල් සඳහා අවශ්‍ය කරනු ලබන උපකරණ හා ද්‍රව්‍ය ලබාදීමේ දී සැබෑ අවශ්‍යතාවය තහවුරු කරගෙන සංස්කෘතික නිලධාරීන්ගේ සම්බන්ධීකරණය යටතේ එය සිදු කළ යුතුය.

8. පරිපාලන වියදම්

ප්‍රාග්ධන වියදම් යටතේ වෙන් කරනු ලබන කිසිදු ප්‍රතිපාදනයකින් පරිපාලන වියදම් නොදැරිය යුතු අතර, එකී වියදම් පුනරාවර්තන වියදම් තුළින් ගලපා ගත යුතුය. මේ පිළිබඳව මුදල් කොමිෂන් සභාවේ අංක FC/3/3/2014 දරන 2014.12.31 දිනැති ලිපියෙන් ලබා දී ඇති උපදෙස් තවදුරටත් බල පැවැත්වේ.

9. පොදු කරුණු

i. භාණ්ඩ, උපකරණ, ආම්පන්න හා ද්‍රව්‍ය ලබාදීමේ දී කිසිම පුද්ගලයෙකුගේ පෞද්ගලික නම, ඡායාරූප හෝ සංකේත ආදිය ඒවායේ සඳහන් නොකළ යුතුය.

ii. විවිධ ආගමික කටයුතු සඳහා පුද්ගලයින් විසින් භාවිතා කරනු ලබන කුමන ආකාරයක හෝ පාරිභෝගික භාණ්ඩ හෝ ද්‍රව්‍ය බෙදාදීම සිදු නොකළ යුතුය.

iii. ව්‍යාපෘති ඇරඹීමට පෙර ශක්‍යතා අධ්‍යයනය පිළිබඳ තිසි සැලකිල්ලක් දැක්වීම සහ ඒ සඳහා අවශ්‍ය නම් විශේෂඥ ආයතනවලින් උපදෙස් හා මග පෙන්වීම් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර, පසුවිපරම හා ඇගයීම ශක්තිමත් කිරීමට පියවර ගත යුතුය.

iv. ව්‍යාපෘති හඳුනා ගැන්මට පෙර එක් එක් ආයතනයන්ට හිමිව ඇති විෂය පථය සීමාව නිරීක්ෂණය කළ යුතු අතර, එකම ප්‍රතිලාභී කණ්ඩායමක් සඳහා ආයතන කීපයකින් සමාන ව්‍යාපෘති හඳුනා ගැනීම නොකළ යුතුය.

මෙම චක්‍රලේඛය පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු අමාත්‍යවරුන්, ගරු මන්ත්‍රීවරුන් සහ සියලුම පළාත් අමාත්‍යාංශවල ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් හා අදාල අනෙකුත් නිලධාරීන් දැනුවත් කළ යුතුය.

2016 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

ඩබ්.එච්.මුණසිංහ
ලේකම්
මුදල් කොමිෂන් සභාව

පිටපත්:

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කා.දැ.ස.
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය - කා.දැ.ස.
3. ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ස.
4. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කා.දැ.ස.
5. ලේකම්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කා.දැ.ස.
6. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
7. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මහා භාණ්ඩාගාරය - කා.දැ.ස.
8. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
9. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
10. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) - අ.ක.ස.
11. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) - අ.ක.ස.
12. සහකාර විගණකාධිපති - අ.ක.ස.